# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2013/31 - 2017 අප්‍රේල් මස 07 වැනි සිකුරාදා - 2017.04.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1069/19 දරන හා 1999.03.05 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර සේවාව පිළිබඳ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින් වර කරන ලද සංශෝධන අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 අප්‍රේල් මස 06 වැනි දින.

**01. ක්‍රියාත්මක වන දිනය :**

මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2016.02.11 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

**02. පත්කිරීම් බලධාරියා :**

ආධුනික III, II, I ශ්‍රේණි : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
විශේෂ ශ්‍රේණිය : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ගණය/ සේවා ගණ :**

අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/ තාක්ෂණික (III, II, I ශ්‍රේණි)
කළමනාකරණ සහකාර - අධි පන්තිය (විශේෂ ශ්‍රේණිය)


1A - G 25389 — 32 (2017/04)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**04. කාර්ය භාරය :**

* ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ විධායකය විසින් නිශ්චිත කොට පවරනු ලබන පිරිස්පාලනය, මුදල් භාරකාරීත්වය හා මුදල් පරිහරණය, අධීක්ෂණය හා මෙහෙයුම් යන කාර්යයන් ඇතුළත් බහුකාර්ය ස්වරූපයේ කාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

* අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන , ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුසාධ්‍යකාරක/ උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණ, මූල්‍ය කළමනාකරණ සහ ද්‍රව්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

**05. වැටුප් (වැටුප් කේත අංකය, වැටුප් පරිමාණය, ආරම්භක වැටුප් පියවර)**

5.1 වැටුප් කේත අංකය : MN 3 - 2006 A ( III, II, I ශ්‍රේණි)
MN 7 - 2006 A (විශේෂ ශ්‍රේණිය)

5.2 වැටුප් පරිමාණය (මාසික) :

III, II, I ශ්‍රේණි : රු.15,005- 4 X 180- 6 X 240-11 X 320- 20 X 360 - 27,885/-
විශේෂ ශ්‍රේණිය : රු. 20,030- 11 X 365- 18 X 500- 33,045/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය* |
|---|---|---|
| III | පියවර 01 | රු. 15,005.00 |
| II | පියවර 12 | රු. 17,485.00 |
| I | පියවර 23 | රු. 21,045.00 |
| විශේෂ | පියවර 04 | රු. 21,125.00 |

5.4 ආධුනිකයින් සඳහා පුහුණුව ලබන කාල සීමාව තුළ ගෙවනු ලබන දීමනාව

රා.ප.ච. අංක 06/2006 (II) ට අනුව පුහුණුව ලබන කාලය තුළදී පහත සඳහන් පරිදි දීමනාවන් ගෙවනු ලැබේ.

පළමු වසර සඳහා මසකට රු. 12,920/- බැගින්
දෙවන වසර සඳහා මසකට රු. 13,040/- බැගින්
තුන්වන වසර සඳහා මසකට රු. 13,160/- බැගින්

**06. සේවයට අයත් තනතුරු :**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

සේවා අවශ්‍යතාව මත වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛවල උපදෙස් වලින් කරනු ලබන වෙනස්කම්වලට යටත්ව පහත සඳහන් කාර්යයන් පවරනු ලැබේ.

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ඉංජිනේරු සහකාර | III, II, I | 636 | දෙපාර්තමේන්තුවේ රෙගුලාසි අනුව වාරිමාර්ග ඉංජිනේරුවරයකුගේ අධීක්ෂණය යටතේ පවරනු ලබන පහත සඳහන් කාර්යයන් :-<br><br>නව හෝ පවතින ගුරුත්ව/ උත්සාන/ ක්ෂුද්‍ර වාරිමාර්ග, ගංවතුර හා කරදිය වැලැක්වීමේ ව්‍යාපාරවල ඉදිකිරීම්/ වැඩිදියුණු කිරීම්/ පුනරුත්ථාපන/ මෙහෙයුම් හා නඩත්තු සහ ජල පාලනය ඵලදායී ලෙස මෙහෙයවීමේ වැඩ සඳහා මූලික විමර්ෂණ, පූර්ණ විමර්ෂණවලට අනුකූලව බිම්මැනුම් සහ මට්ටම් ගැනීම, සීමිත පරිමාණයේ සිවිල් ඉංජිනේරුමය නිර්මාණ සහ සැලසුම් පිළියෙල කිරීම, අදාළ පිඹුරුපත් පිළියෙල කිරීම, ප්‍රමාණ සමීක්ෂණය, මිල ගණන් විශ්ලේශණය හා ඇස්තමේන්තු පිළියෙල කිරීම. සම්මත පිරිවිතර අනුව ප්‍රසම්පාදන ලිපිලේඛන පිළියෙල කිරීම, වැඩ අධීක්ෂණය, සංවිධානය තත්ව පාලනය. ක්ෂේත්‍ර/ වැඩබිම්වල යන්ත්‍රෝපකරණ, ඉන්ධන, ද්‍රව්‍ය හා ගබඩා කළමනාකරණය හා අදාළ ගණන්දීම. ක්ෂේත්‍ර/ඒකක භාර නිලධාරී, වාරිමාර්ග ව්‍යාපාරයන්හි ව්‍යාපාර කළමනාකරු ලෙස ආයතනික සංවිධාන සංවර්ධනය හා පුහුණු කිරීම, වැඩ පරිපාලකවරුන්ගේ/ තාක්ෂණ සහයකවරුන්ගේ, ක්ෂේත්‍ර සහකාරවරුන්ගේ සහ කම්කරුවන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම. වාරිමාර්ග ආඥා පනත හා අනෙකුත් නීති පනත් මගින් දෙපාර්තමේන්තුව වෙත පැවරෙන රාජකාරී සම්බන්ධයෙන් ක්ෂේත්‍ර කටයුතු සහ පවරනු ලබන අනෙකුත් ඉංජිනේරුමය උපවෘත්තික කාර්යයන්. |
| කොට්ඨාශ සහකාර | විශේෂ | 65 | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කලින් කලට නිකුත් කරනු ලබන දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා මුදල් චක්‍රලේඛවලින් බලය පැවරීම අනුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුගේ අධීක්ෂණය යටතේ කොට්ඨාශයට අදාළ ගෙවීම් කටයුතුවලදී ඉන්වෙන්ට්‍රි හා ඇනවුම් පත්‍ර නාමලේඛන, බෙදාහැරීමේ ලේඛන, කරන ලද වැඩවල මිණුම්, මාසික ප්‍රගති පිරිවැය, සියලුම වාහනවල දෛනික ධාවන සටහන් පරීක්ෂා කිරීම. ගෙවීම් සහතික කිරීම, මුදලින් කෙරෙන සියලුම ගෙවීම් කිරීම, දෙවැනි අත්සන්කරු වශයෙන් චෙක්පත් අත්සන් කිරීම. සුලු මුදල් පොත හා ගෙවීම් මුදල් පිළිබඳ උපයෝගී ලේඛන නඩත්තු කිරීම. ගබඩා, කම්කරු, වාහන හා කාර්යාල පරිපාලනයේදී කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු/ නේවාසික ඉංජිනේරුවරුන්ට සහායවීම සහ එම රාජකාරී ආවරණය කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

ඉංජිනේරු සහකාර III, II, I ශ්‍රේණි 636

ශ්‍රේණි උසස්වීම් සඳහා III, II හා I ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් ලෙස සැලකේ.

6.3 තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

7.1 බඳවා ගන්නා අනුපාතය :

| *ධාරාව* | *ප්‍රතිශතය* | *අනුපාතය (අනුමත නිලධර සංඛ්‍යාව අනුව)* | |
|---|---|---|---|
| | | *පුරුෂ* | *ස්ත්‍රී* |
| විවෘත | 90% | 75% | 25% |
| සීමිත | 10% | 75% | 25% |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය

7.2.1.1. ආධුනිකයන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් (වසර තුනක පුහුණුව සඳහා)

අධ්‍යාපන සුදුසුකම් :

(i) සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සමඟ

(ii) පැරණි විෂය නිර්දේශය අනුව භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය හා රසායන විද්‍යාව යන ක්ෂේත්‍රයට අදාළ විෂයන්ගෙන් එක් වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම.

හෝ

නව නිර්දේශය අනුව, උසස් ගණිතය හෝ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන ක්ෂේත්‍රයට අදාළ විෂයයන් තුනකින්, අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම.

වෘත්තීය සුදුසුකම් - අදාළ නොවේ.

7.2.1.2. III වන ශ්‍රේණිය (ඍජු බඳවා ගැනීම)

(අ) අධ්‍යාපන සුදුසුකම් :

(I) සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය විද්‍යාව සහ තවත් විෂයයන් එකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සමඟ

(II) පැරණි විෂය නිර්දේශය අනුව භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය හා රසායන විද්‍යාව යන ක්ෂේත්‍රයට අදාළ විෂයන්ගෙන් එක් වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම.

හෝ

නව නිර්දේශය අනුව, උසස් ගණිතය හෝ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන් තුනකින් එක් වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම.

(ආ) වෘත්තීය සුදුසුකම්

(I) ගල්ගමුව, කොත්මලේ වාරිමාර්ග අභ්‍යාස ආයතනයක වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

(II) මොරටුව කටුබැද්ද විශ්වවිද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

(III) මට්ටක්කුලිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා තිබීම.

හෝ

(IV) කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

(V) විවෘත විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) සහතිකය ලබා තිබීම.

හෝ

(VI) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉහත පාඨමාලාවන්ට සමාන පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

මෙම පාඨමාලා NVQ 6 මට්ටමේ විය යුතුය.

සටහන :

(I) III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණුව සඳහා බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III වන ශ්‍රේණියට පළමුව බඳවා ගත යුතුය.

(II) බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III වන ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවේ නම්, ඉහත 7.2.1.1 පරිදි සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ඉතිරි පුරප්පාඩු සඳහා ආධුනිකයින් බඳවා ගනු ලැබේ.

7.2.2. කායික සුදුසුකම් :

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.3. වෙනත් :

* ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

* විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

* සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.2.4. වයස :

7.2.4.1. අවම සීමාව : අවුරුදු 18 යි.

7.2.4.2. උපරිම සීමාව : අවුරුදු 30 යි.

7.2.5. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුලු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.2.5.1. ලිඛිත විභාගය
(විෂය නිර්දේශය උපලේඛනය 01 හි සඳහන් වේ.)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | 100 | 40 |

7.2.5.1.1. පවත්වන බලධරයා : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.5.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.5.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.5.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබා දෙනු නොලැබේ.)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා සහතික පත්‍ර පරීක්ෂාකර බැලීම සඳහා.

7.2.5.4.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

7.2.6. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය

7.3.1.1. ආධුනිකයන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් (වසර දෙකක පුහුණුව සඳහා)

(අ) අධ්‍යාපන සුදුසුකම් ඃ

(I) සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් ඃ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් තුන් අවුරුදු අර්ධ කාලීන ජාතික තාක්ෂණ සහතිකපත්‍ර(සිවිල්) පාඨමාලාව සමත් වී NVQ 4 මට්ටමේ අදාළ සහතිකය (NCT - Civil) ලබාගෙන තිබීම.

(ඇ) පළපුරුද්ද ඃ

(I) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ 3 සේවා ගණයෙහි තාක්ෂණික සහායක තනතුරෙහි අවම වශයෙන් වසර 10 ක ස්ථිර සේවා කාලයක් සහිත නිලධාරියකු වීම.

7.3.2. කායික සුදුසුකම් ඃ

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.3. වෙනත් ඃ

I. තනතුර ස්ථිර කර තිබිය යුතුය.

II. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති දෙපාර්තමේන්තු සේවකයකු විය යුතුය.

III. පූර්වාසන්න වසර 05 ක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළි ගනු ලබන්නේ නිලධාරියා සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

V. අවවාද කිරීමක් හැර ආසන්න වසර 05 ක් තුළ කිසිදු විනය දඬුවමකට යටත්ව නොතිබීම.

7.3.4. වයස ඃ

7.3.4.1. අවම සීමාව ඃ අදාළ නොවේ.

7.3.4.2. උපරිම සීමාව ඃ අවුරුදු 45 යි.

7.3.5. බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුලු ලකුණුවල කුසලතාවය අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.3.5.1. ලිඛිත විභාගය

(විෂය නිර්දේශය උපලේඛන 03 හි සඳහන් වේ.)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | 100 | 40 |

7.3.5.1.1. පවත්වන බලධරයා : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.3.5.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.5.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා සහතික පත්‍ර පරීක්ෂාකර බලා ඒ අනුව ලකුණු ලබා දී කුසලතා අනුපිළිවෙල මත සුදුස්සන් තෝරා ගැනේ.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 35 | අදාළ නොවේ. |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 | |
| අතිරේක පලපුරුද්ද | 25 | |
| වෙනත් සුදුසුකම් | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 5 | |
| එකතුව | 100 | |

සටහන :

i. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

ii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවාගනු ලැබේ.

7.3.5.3.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

7.3.5.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.6. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය ඃ

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4. කුසලතා පදනම මත බඳවා ගැනීම ඃඅදාළ නොවේ.

**08. කාර්යක්ෂමතා කඩඉම්**

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| පළමු කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත්වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් (උපලේඛනය 04) |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට උසස්වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් (උපලේඛනය 05) |
| තෙවන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වී වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් (උපලේඛනය 06) |

සටහන ඃ-

(අ) අංක 1069/19 හා 1999.03.05 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයෙන් ප්‍රකාශිත සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වනු ලබන කණිෂ්ඨ කාර්මික විභාගය සම්පූර්ණයෙන් සමත්වූවන් පළමුවන කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්වූවන් ලෙස සලකනු ලැබේ.

(ආ) අංක 1069/19 හා 1999.03.05 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයෙන් ප්‍රකාශිත සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගයේ පළමුවන භාගයේ පළමුවන හා දෙවන කාණ්ඩයන් සහ දෙවන භාගයේ දෙවන කාණ්ඩයෙහි "ආ" හි විෂයයන්ගෙන් සමත්වූවන් දෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්වූවන් ලෙස සලකනු ලැබේ.

(ඇ) අංක 1069/19 හා 1999.03.05 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයෙන් ප්‍රකාශිත සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගයේ පළමුවැනි භාගයෙහි I හා II කාණ්ඩයද දෙවැනි භාගයෙහි II කාණ්ඩයෙහි (අ) කොටසද, දෙවැනි භාගයෙහි II කාණ්ඩයෙහි (ආ) කොටසද යන විෂයයන්ගෙන් සමත්වූවන් තෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්වූවන් ලෙස සලකනු ලැබේ.

(ඈ) මෙම සේවා ව්‍යවස්ථාව බලාත්මක වන දිනය වන විට I ශ්‍රේණියට උසස් වීමෙන් පසු වසර පහක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් වැටුප් වර්ධක පහ (05) ක් උපයා ගෙන ඇති නිලධාරීන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

8.2. කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් දඃ වසරකට දෙවරක්

8.3. කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් දඃ

| | |
|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම<br>දෙවන කාර්යක්ෂමතා කඩඉම<br>තෙවන කාර්යක්ෂමතා කඩඉම | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් |

**09. භාෂා ප්‍රවීණතාව**

9.1.

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍යභාෂාව | රාජ්‍යභාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍යභාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළදී ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍යපරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළමට්ටමේ ප්‍රවීණතාවය ලබාගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම්**

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් ඃ

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

VI. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමයඃ

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2. II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම් ඃ

I. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය ः

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.3. I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ගණයේ වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06)ම උපයා ගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

V. ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගයේ පළවැනි භාගයේ I හා II කාණ්ඩ ද දෙවැනි භාගයෙහි II කාණ්ඩයෙහි (අ) කොටසද දෙවැනි භාගයෙහි II කාණ්ඩයෙහි (ආ) කොටසද යන විෂයයන්ගෙන් සමත් වීම.

10.3.1.2. උසස් කිරීමේ ක්‍රමය

විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු ඇති වූ විට ඉහත සුදුසුකම් සම්පූර්ණ කළ ඉංජිනේරු සහකාරවරුන්ගෙන් රාජ්‍ය සේවා කොමිසමේ නියමය පරිදි වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අයදුම්පත් කැඳවා පුරප්පාඩු ඇති වූ දින සිට ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත සම්මුඛ පරීක්ෂණයකින් ලබන ලකුණු මත විශේෂ පන්තියට උසස් කරනු ලැබේ.

10.4. සංලක්ෂය ः

සාමාන්‍ය මට්ටමේ කාර්යසාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

**11. තනතුරුවලට පත් කිරීම.**

11.1. සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|
| කොට්ඨාශ සහකාර | විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙක් වීම | ජ්‍යෙෂ්ඨත්වය අනුව |

**12. සේවයට අදාළ කොන්දේසි**

ආධුනික කාල සීමාව අවසානයේදී III වන ශ්‍රේණියට බඳවා ගැනීම.

(I) විවෘත ධාරාව යටතේ ආධුනිකයින් ලෙස ඇතුලත් කර ගනු ලබන අයදුම්කරුවන් වාරිමාර්ග විෂයභාර අමාත්‍යාංශය/ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ඇති ගල්ගමුව, කොත්මලේ හා කොළඹ වාරිමාර්ග අභ්‍යාස ආයතනයන්හි පවත්වනු ලබන වර්ෂ දෙකක (02) න්‍යායාත්මක හා එක් වර්ෂයක ප්‍රායෝගික වශයෙන් වර්ෂ තුනකින් සමන්විත පූර්ණ කාලීන පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය මගින් පිරිනමනු ලබන වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය ලැබීමට සුදුසුකම ලබති. සීමිත ධාරාව යටතේ ආධුනිකයින් ලෙස ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන පරිදි ගල්ගමුව වරිමාර්ග අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂගේ අධීක්ෂණය යටතේ වසර දෙකක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සමත්වීමෙන් පසුව ඉහත සහතිකය ලබාදීම සඳහා ප්‍රමාණවත් වේ. වසරක ප්‍රායෝගික පුහුණුව ලබාදීමේදී අවස්ථානුකූලව අවශ්‍යතා හා පහසුකම් තිබෙන ආකාරයට එම පුහුණුව ව්‍යුහගත කරනු ඇත. සමාසික ක්‍රමයක් (semester system) අනුව ක්‍රියාත්මක වන මෙම පාඨමාලාවෙහි එක් එක් සමාසික අවසානයේ පවත්වන පරීක්ෂණයේ ප්‍රතිඵලවල සාමාන්‍යය මත පාඨමාලාවේ සමස්ත කුසලතාව තීරණය වේ. එම සහතිකය ලැබීම මත ඔවුන් ඉංජිනේරු සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

*සටහන :* සීමිත ධාරාව යටතේ ආධුනිකයින් ලෙස ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් පුහුණුව අවසානයේ පැවැත්වෙන පරීක්ෂණය විවෘත ධාරාව යටතේ බඳවා ගන්නා අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන පුහුණුවට අදාළ පරීක්ෂණ මට්ටමේ විය යුතුය.

(II) නියමිත විභාගවලින් අසමත් වන, වාරිමාර්ග ඉංජිනේරු සහකාර අභ්‍යාසලාභීන්ට එසේ අසමත් වූයේ වැඩ කටයුතු පැහැර හැරීම, උනන්දුව නැතිවීම හෝ අයහපත් පැමිණීම නිසා නොවේ නම්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි ඔවුන්ගේ පුහුණුව මාස හයකට නොවැඩි කාල පරිච්ඡේදයකින් දීර්ඝ කරවා ගැනීමට ඉඩ ප්‍රස්තාව ඇත. අසමත් වූ ඉංජිනේරු සහකාර අභ්‍යාසලාභීන් එසේ දීර්ඝ කරන ලද පුහුණුවීමේ කාල පරිච්ඡේදය අවසානයේදී ඔවුන් සඳහා පවත්වන අවසාන විභාගය ඇතුලු නියමිත විභාග සියල්ලෙන්ම සමත්විය යුතුයි. එලෙස ද අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම් කළ ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ. දීර්ඝ කරනු ලබන පුහුණු කාලසීමාව තුළදී පුහුණු අභ්‍යාසලාභීන් සඳහා අදාළ දීමනාව ලබා දෙනු නොලැබේ.

(III) පුහුණුව ලබන කාලය තුළදී ඉංජිනේරු සහකාර අභ්‍යාසලාභීන් යටත්පිරිසෙයින් දේශන හා ප්‍රායෝගික අභ්‍යාසවලින් 80% කට වත් සහභාගීවී සතුටුදායක පුහුණුවීමේ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය අවම පැමිණීම හා සතුටුදායක පුහුණුවීමේ වාර්තාවක් නැති යම්කිසි ඉංජිනේරු සහකාර අභ්‍යාසලාභියෙක් වෙතොත් නියමිත විභාගයට පෙනී සිටීමට ඉඩ නොදෙන අතර පුහුණුව ද අවසන් කරනු ලැබේ.

(IV) සීමිත ධාරාව යටතේ තෝරාගත් ආධුනිකයින්, ආධුනික කාල සීමාවේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තව දුරටත් රැඳී සිටිය යුතු අතර පුහුණු පාඨමාලාව අවසානයේ පවත්වන විභාගය සමත් වන තුරු ඉංජිනේරු සහකාර සේවයේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු කාල සීමාව සතුටුදායක ලෙසගත කරන නිලධාරියකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහළ වැටුප් පියවරෙහි පිහිටවනු ලබන අතර දීමනාව තව දුරටත් ගෙවනු ලැබේ. පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කොට විභාගය සමත් වීමෙන් පසු 2000.03.02 දිනැති අංක 7/2000 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැටුප් පරිවර්තනය කරනු ලැබේ.

(V) ඉංජිනේරු සහකාර III ශ්‍රේණියට සෘජුවම බඳවා ගන්නා ලද ඉංජිනේරු සහකාරවරුන්ට න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව ද ඇතුළත් වන සේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන හය මසක සේවාස්ථ පුහුණුවක් ලබාදෙනු ලැබේ. ඉන් අනතුරුව පවත්වනු ලබන න්‍යායික හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්වීමේදී දක්වන කුසලතාවය මත ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය වේ.

**පොදු කරුණු**

ඉංජිනේරු සහකාර සේවයේ පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් බඳවාගන්නා ප්‍රමාණය තීරණය කරනු ලැබේ. බඳවා ගනු ලබන අභ්‍යාසලාභීන් පුහුණුව ඇරඹීමට පෙර වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග ගිවිසුමකට එළඹිය යුතුය.

13. අර්ථ නිරූපණ හා නිර්වචන :

I. "ගැසට් පත්‍රය" යන්නෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය වේ.

II. "සේවා ව්‍යවස්ථාව" යන්නෙන් අදහස් කරනුයේ වාරිමාර්ග දෙපාර්තෙමින්තුවේ ඉංජිනේරු සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය වේ.

III. "ක්‍රියාත්මක වන දිනය" යනුවෙන් අදහස් කරනුයේ මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වේ.

IV. "සේවය" යනුවෙන් අදහස් කරනුයේ වාරිමාර්ග දෙපාර්තෙමින්තුවේ ඉංජිනේරු සහකාර සේවය වේ.

V. "සක්‍රීය සේවා කාලය යනු නිලධාරියා ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් සේ සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයක් හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය."

14. ශේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

14.1. මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති MN-03-2006-A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.2. සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුවද අන්තර් ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලග ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

14.3. සේවයේ III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පවතින සේවා ව්‍යවස්ථාවේ II වන පන්තියේ II ශ්‍රේණියේ සිටින නිලධාරීන්

14.4. සේවයේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පවතින සේවා ව්‍යවස්ථාවේ II වන පන්තියේ I ශ්‍රේණියේ සිටින නිලධාරීන්

14.5. සේවයේ I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පවතින සේවා ව්‍යවස්ථාවේ I වන පන්තියේ සිටින නිලධාරීන්

14.6. සේවයේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පවතින සේවා ව්‍යවස්ථාවේ විශේෂ පන්තියේ සිටින නිලධාරීන්

15. අන්තර්කාලීන විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට වසර 03ක් දක්වා බලපැවැත්වේ. මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට III වන හා II වන ශේණියට අන්තර්ග්‍රහණය වන නිලධාරීන්ට උසස්වීම් ලබාදීමේදී අන්තර්කාලය තුළදී අදාළ කර ගත යුත්තේ 1999.03.05 දිනැති අංක 1069/19 දරණ අති විශෙෂ ගැසට් නිවේදනයේ

සඳහන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර සේවා ව්‍යවස්ථාවය.(මෙම අන්තර්කාලීන විධිවිධාන අදාළ වන්නේ නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති 1999.03.05 දිනැති අංක 1069/19 දරණ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්මික සේවා ව්‍යවස්ථාව යටතේ බඳවාගත් නිලධාරීන් සඳහා පමණි. අනෙකුත් කොන්දේසි නව සේවා ව්‍යවස්ථාව අනුව වේ.)

**16. වෙනත්**

I. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

II. මෙම ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

III. මෙම සේවා ව්‍යවස්ථාවෙහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිටපත්වල කරුණු අතර යම් අනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල පිටපත බලාත්මක වේ.

උපලේඛනය - 01

01. විභාගයේ නම : ඉංජිනේරු සහකාර සේවයට ආධුනිකයින් ලෙස බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

02. විභාගය පිළිබඳ විස්තරය : (බහුවරණ ප්‍රශ්න පත්‍රයකි)

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40 |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 2 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | සිතීමේ තර්කානුකූලතාවයත් විශ්ලේෂණ හැකියාවත් තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීමත් පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය (ගණිතය, භෞතික විද්‍යාව) | මූලික වීජ ගණිතය, ඛණ්ඩාංග ජ්‍යාමිතිය, කලනය, ත්‍රිකෝණමිතිය හා ද්‍රවස්ථිතිය, ස්ථිති විද්‍යාව, විද්‍යුතය, යාන්ත්‍ර විද්‍යාව, තාපය, සංඛ්‍යානය ආදී කොටස් පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

උපලේඛනය - 02

01. විභාගයේ නම : ඉංජිනේරු සහකාර III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

02. විභාගය පිළිබඳ විස්තරය : (බහුවරණ ප්‍රශ්න පත්‍රයකි)

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | සිතීමේ තර්කානුකූලතාවයන් විශ්ලේෂණ හැකියාවත් තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීමත් පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ |

උපලේඛනය - 03

01. විභාගයේ නම : ඉංජිනේරු සහකාර සේවයට ආධුනිකයින් ලෙස බඳවා ගැනීමේ සීමිත තරග විභාගය

02. විභාගය පිළිබඳ විස්තර : (බහුවරණ ප්‍රශ්න පත්‍රයකි)

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40 |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 2 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | සිතීමේ තර්කානුකූලතාවයන් විශ්ලේෂණ හැකියාවත් තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීමත් පිළිබඳ දැනුම පරීක්ෂ කෙරේ |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය (ගණිතය, භෞතික විද්‍යාව) | මූලික විජ ගණිතය, බණ්ඩාංග ජ්‍යාමිතිය, කලනය, ත්‍රිකෝණමිතිය හා ද්‍රවස්ථිතිය, ස්ථිති විද්‍යාව, විද්‍යුතය, යාන්ත්‍ර විද්‍යාව, තාපය, සංඛ්‍යානය ආදී කොටස් පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

උපලේඛනය - 04

01. විභාගයේ නම : ඉංජිනේරු සහකාර තනතුරෙහි පළමු කාර්යකෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තරය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| මිණුම් හා මට්ටම් ගැනීම (ලිඛිත පරීක්ෂණය) | පැය 3 | 100 | 40 |
| ප්‍රමාණ සමීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) | පැය 3 | 100 | 40 |

සටහන : කණිෂ්ඨ කාර්මික විභාගය සමත් ඉංජිනේරු සහකාරවරුන් ද පළමු වන කාර්යක්ෂමතා කඩඉම සමත් ලෙස සලකනු ලැබේ.

03. විභාගය පවත්වනු ලබන බලධරයා : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| මිණුම් හා මට්ටම් ගැනීම (ලිඛිත පරීක්ෂණය) | මැනුම් විද්‍යාවේ මූල ධර්ම<br>තියොඩලයිට්ටුව සහ එහි සීරුමාරුව<br>තියොඩලයිට්ටුව ආධාරයෙන් පරික්‍රමණ මිණුම් සිතියම් ගත කිරීම<br>තකියොමෙට්‍රික මැනීම (Tacheometric)<br>බේස් ලයින් මිනුම්<br>විවිධ ලෙවල් උපකරණවල භාවිතය හා ප්‍රයෝජන<br>ලෙවල් උපකරණයේ සීරුමාරුව<br>දික්කඩ සහ හරස්කඩ ඇඳීම<br>සමෝච්චරේඛා මැනීම<br>පරිමා ගණනය කිරීම |
| ප්‍රමාණ සමීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) | නිර්මිතයක කොටසක :<br>1. සම්මත පිරිවිතර භාවිතයෙන් ප්‍රමාණ පත්‍රයක් පිළියෙල කිරීම<br>2. වැරගැන්නුම් ලේඛණයක් (Bar Schedule) පිළියෙල කිරීම<br>3. ඇස්තමේන්තුවක් පිළියෙල කිරීම |

උපලේඛනය - 05

01. විභාගයේ නම : ඉංජිනේරු සහකාර තනතුරෙහි දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | පැය 03 | 100 | 40 |
| ආයතන සංග්‍රහය සහ දෙපාර්තමේන්තු රෙගුලාසි | පැය 03 | 100 | 40 |

සටහන : විභාගය සමත්වීම සඳහා එක් විෂයයකට අවම වශයෙන් 40%කට නොඅඩුව ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතු ය. ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගයේ පළමුවන භාගයේ පළමුවන හා දෙවන කාණ්ඩයන් සහ දෙවන භාගයේ දෙවන කාණ්ඩයෙහි ''ආ'' හි විෂයයන්ගෙන් සමත් ඉංජිනේරු සහකාරවරුන් ද දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් ලෙස සලකනු ලැබේ.

03. විභාගය පවත්වනු ලබන බලධරයා : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| මුදල් රෙගුලාසි | (1) ඒකාබද්ධ අරමුදල<br>(2) වාර්ෂික ඇස්තමේන්තු<br>(3) වාර්ෂික ඇස්තමේන්තුවල වෙනස්කිරීම්<br>(4) ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්, ගණන්දීමේ නිලධාරින්, රාජ්‍ය ආදායම් ගිණුම්කරණය, ගෙවීම්වලට බලය දෙන නිලධාරිහු, අනුමත කිරීම, සහතික කිරීම, බලය පැවරීම, පාඩු සහ පොතෙන් අස් කිරීම, රජයේ අරමුදල් භාරව සිටීම, ගෙවීම්වලට සහ ලැබීම්වලට අදළ කාර්ය පටිපාටිය, අගරු චෙක්පත් ගෙවීම්වලට අදළ කාර්ය පටිපාටිය,<br>(5) රජයේ අරමුදල්වල ආරක්ෂාව, සමීක්ෂණ මණ්ඩල, අයිරා, බැංකු ගිණුම්<br>(6) වැඩ සහ සේවා - ඉදිකිරීම් දෙපාර්තමේන්තු<br>(7) ගබඩා සමීක්ෂණ, බඩු බාර ගැනීම, බඩු මිලට ගැනීම හා බඩු සැපයීම පිළිබඳ කාර්ය පටිපාටිය,<br>(8) කොන්ත්‍රාත්-ටෙන්ඩර් කාර්ය පටිපාටියෙන් බැහැරව ක්‍රියාකිරීම (Forced Account) |
| ආයතන සංග්‍රහය සහ දෙපාර්තමේන්තු රෙගුලාසි | (i) කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටිය රීති සංග්‍රහයේ VI සිට VIII පරිච්ඡේද<br>ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද<br>VII - අතිකාල දීමනා, නිවාඩු දවස් සහ නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා<br>XII නිවාඩු<br>XIII දුම්රිය බලපත්‍ර<br>XIV දිවයින ඇතුළත රාජකාරී ගමන්<br>XVI නිවාඩු ගමන්<br>XIX රජයේ නිවාස<br>XXVIII පරිපාලන කාර්ය පටිපාටි සහ විධි<br>XXX රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XI, VII සාමාන්‍ය හැසිරීම සහ විනය |

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| | (ii) දෙපාර්මේන්තු විධිවිධාන<br><br>වාරිමාර්ග ආඥපනතේ VI වන කොටස 8, 9, 10, 14 හා අනෙකුත් විධිවිධාන සහ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු පිළිබඳ විධිවිධාන<br><br>1994 අංක 13 දරන සංශෝධිත වාර්මාර්ග ආඥපනත<br>ගොවිජන සංවර්ධන පනතේ ගොවි සංවිධාන පිළිබඳ විධිවිධාන<br>ගංවතුර ආරක්ෂණ පනත ඇතුළු වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු හා සම්බන්ධ අනෙකුත් අණපනත් පිළිබඳ සාමාන්‍ය අවබෝධය |

උපලේඛනය - 06

01. විභාගයේ නම : ඉංජිනේරු සහකාර තනතුරෙහි තෙවන කාර්යකෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තරය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | පැය 3 | 100 | 40 |
| වාරිමාර්ග ව්‍යාපෘති සැලසුම්කරණය | පැය 3 | 100 | 40 |

සටහන : විභාගය සමත්වීම සඳහා එක් විෂයයකට අවම වශයෙන් 50%කට නොඅඩුව ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතු ය. ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගයේ පළමුවැනි භාගයෙහි I හා II කාණ්ඩ ද දෙවැනි භාගයෙහි II කාණ්ඩයෙහි (අ) කොටස ද, දෙවැනි භාගයෙහි II කාණ්ඩයහි (ආ) කොටස ද යන විෂයයන්ගෙන් සමත් වූවන් තෙවන කාර්යකෂමතා කඩඉමෙන් සමත් වූවන් ලෙස සලකනු ලැබේ.

03. විභාගය පවත්වනු ලබන බලධරයා : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | වාරිමාර්ග ව්‍යාපෘතියට අදාළ මුදල්, යන්ත්‍ර සූත්‍ර, කම්කරු, ක්‍රමවේද, ඉදිකිරීම් ද්‍රව්‍ය පිළිබඳ කළමනාකරණ දැනුම පරීක්ෂා කිරීම. |
| වාරිමාර්ග ව්‍යාපෘති සැලසුම්කරණය | වාරිමාර්ග ව්‍යාපෘතියකට අදළව සියලුම කොටස්වල මූලික සැලසුම්කරණ දැනුම් පරීක්ෂා කිරීම, (වේලි, ගොඩනැගිලි, මාර්ග, ඇලමාර්ග, සොරොව්, පිටවාන, අමුණු, ගේට්ටු ආදිය) |

උපලේඛනය - 07

ඉංජිනේරු සහකාර සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය

ලකුණු ලබාදීම පහත පරිදි වේ.

1. ජ්‍යෙෂ්ඨත්වය - ලකුණු 60

(වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ I වන ශ්‍රේණියට උසස් කර වසර 06ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වීමෙන් පසුව එළඹෙන සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එක් වසරක් සඳහා ලකුණු 10 බැගින්)

2. ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා අවබෝධය - ලකුණු 30

| | |
|---|---|
| විමර්ශන | - ලකුණු 6 |
| ඉදිකිරීම් | - ලකුණු 6 |
| ජල කළමනාකරණය | - ලකුණු 6 |
| ව්‍යාපාර කළමනාකරණය | - ලකුණු 6 |
| මෙහෙයුම් හා නඩත්තු | - ලකුණු 6 |

3. කාර්ය සාධන ඇගයීම් (පූර්වාසන්න වසර පහක) - ලකුණු 10

| | |
|---|---|
| විශිෂ්ඨ | - ලකුණු 10 |
| සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල | - ලකුණු 08 |
| සතුටුදායක | - ලකුණු 06 |
| අසතුටුදායක | - ලකුණු 00 |

04-666

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.